# මහා පරාක්‍රමබාහු රජතුමා, වී කුරුණිය සහ ස්වයංපෝෂිත භාවය

(පුරාවෘත්තයක් ආශ්‍රයෙන් සකස් කරන ලද්දකි.)

අනුරාධපුර දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලයයේ බන්දුල ජයකොඩි මහතා විසිනි

"මිහි පොළොවට වැටෙන වැසි බිඳකුදු ප්‍රයෝජනයකට නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොතබව්" යනුවෙන් විහසි බෙනෙමින් ලංකා භූමිය ආහාරයෙන් ස්වයංපෝෂිත කිරීමේ දැඩි ප්‍රයත්නයක යෙදී සිටි මහා පරාක්‍රමබාහු රජතුමා දිනක් රාජ පුරුෂයෙකු අමතා අසල ගම්මානයකට ගොස් වී කුරුණියක් මිලයට ගෙන එවයි අණ කෙළේය. එසේම එම වී කුරුණිය ගෙන එන්නේ තමාට බැව් රහසක් වශයෙන් තබාගත යුතු බවටද නියම කළහ.

*　　*　　*

මද වේලාවක් ගත විය. රාජ පුරුෂයා වී කුරුණියක්ද සමග නරනාථයා ඉදිරියෙහි පෙනී සිටියේය. වී පිරවූ කුරුණිය දෙස බැලූ මහරජු, "එම්බා...සෙනවිය, වී සොයමින් තොප කෙතෙක් දුර ගියෙහිද ?" යි පිළිවිසීය. "නැත, දේවයන් වහන්ස...නැත. වැඩි දුරක් යාමට සිදුවූයේ නැත. වාසල අසලින්ම වී කුරුණිය මිළදී ගැනීමට හැකිවීයැ" යි සෙබලා පිළිතුරු දුන්නේය.

එහෙත්, ඒ මහරජු බලාපොරොත්තු වූ පිළිතුර නොවීය. සිංහාසනයට බරදී කල්පනා වට වැටුනු රජතුමා පසුදින ඇමති මණ්ඩලය රැස්කොට, ස්වකීය අමාත්‍ය ගණයා අමතා ලංකාද්වීපය තවමත් ආහාර අතින් ස්වයංපෝෂිත නොවූ බවත්, අගහිඟකම් තවමත් රාජ්‍යයෙ රැඳී ඇති බවත් දක්වා, ආහාර නිෂ්පාදන කටයුතු වැඩි වැඩියෙන් පවත්වා ගෙන යායුතු බවට නියෝග කෙළේය.

*　　*　　*

මෙපරිද්දෙන් තවත් කලක් ගෙවී ගියේය. රජතුමා නැවතත් දවසක් රාජ පුරුෂ යෙකු බනවා පෙර මෙන් මුදල් දී, වී කුරුණියක් මිලදී ගෙන එවයි ඇණවීය. එසේම මෙම වී මහරජුට විග රහසක් කොට තබාගතයුතු බවටද අණ කළහ. හෙතෙමේද වී කුරුණියක් මුදලට ගතහැකි තැනක් සොයා ගෙන් ගෙට ගියේ... තරමක් වෙහෙස විඳ ආ කාරිය සපුරාගෙන පෙරළා මාලිගාවට විත්තේය. එහෙත්, මෙවර වෙනසකට චූයේ මුල් වී කුරුණියට වඩා මෙම වී කුරුණිය මිල අඩුවීමය.

"කෙසේද දරුව, වී ලබාගන්නට අපහසුවක් විනිද ?" යි රජු පිළිවිසීය.

"එසේය, දේවයන් වහන්ස, මේ වෙනුවෙන් නැතක් වෙහෙසගෙන බොහෝ දුරක් යාමට සිදුවිය".

"එය එසේ වූයේ රාජ්‍යයේ හැම නිවෙසකම වී ඇතිවිත්, වී විකුණාගෙන කන්නට තරම් වූ නැති බැරි කමෙක් කිසිදු නිවෙසක නොවූ හෙයිනැ" යි රාජපුරුෂ තෙමේ පිළිවදන් දුන්නේය.

නැවතද, තම අමාත්‍ය මණ්ඩලය රැස්කරවූ මහා පරාක්‍රමබාහු රජතුමා තම අභිමතාර්ථය වූ පරිද්දෙන්, රට තවමත් ස්වයංපෝෂිත නොවූ බැව් පළ කෙළේය.

'ලංකාද්වීපය තවමත් සුඛිත මුදිත වී නැත්තේය' යි ප්‍රකාශ කොට නැවතද වරක්, වඩාත් ප්‍රබල අන්දමින් ගොවිකම් කටයුතු ව්‍යාප්ත කරවමින් ගොවිකමෙහි නියුක්ත වනලෙස අණ ලැවිය.

මේ කටයුතු මැද කාලය ගෙවීයත්ම, තවත් දවසක වෙනත් වාසල සේවකයෙකු ඇමතූ රජතෙමේ, යම් මුදලක් අත තබා..." දරුව, මේ ගෙන ගොස් මට නොකියා වී කුරුණියක් මිලට ගෙන එව" යි නිල කළහ.

හෙතෙමේද ගෙයක් නෑර ගියේය. ගමක් නෑර ගියේය. රටේ හැම අහුමුලුවෙක්ම නෑර ගියේය. ඒත් වී කුරුණියක් නොව, එක දී ඇටයක් මසුරන් මිල ගෙවාත් ලබාගත හැකි තැනක් සොයා ගැනීමට ඔහුට නොපිලිවන් විය. දින කිහිපයකට පසුව වාසල සේවකයා බොහෝ වෙහෙස විඳ වී කුරුණියක්ද රැගෙනවිත් එයද, ඊට ගෙවන ලෙස දුන් මිලද රජතුමා වෙත ආපසු පිලිගැන්වීය.

" කිමෙක්ද, දරුව ?......වීත්, මුදලුත් දෙකම... ? ඇයි......වී වලට ගම්වැස්සන් මිල අය නොකෙළේද ? "

" එසේය, දේවයන් වහන්ස, ගමක් නෑර, ගෙයක් නෑර සැරි සැරීමි. එතෙකුදු වුවත්, වී විකුණනා එකද ගොවියෙකුවත් සොයාගත නොහුනෙමි. හැම තැනකම අටුකොටු අළුත් අස්වැන්නෙන් පිරී'තිරී ගොස් ඇත. ඔවුන්ට වී විකුණාගෙන කන්නට තරම් අගහිඟයක් හෝ අහේනියක් නැත්තේය. මේ වී කුරුණියට මුදල් ගන්නට කිසිවෙකුත් කැමැති නොවීය. එනිසා ඒ ආපසු ගෙනෙන්නට සිදුවිය."

" දරුව......එපමණක්ද " ?

" නැත, දේවයන් වහන්ස, ඒ පමණක් නොවේ. අපට වී විකුණන්නට ඕනෑකමක් නැත. අපේ අටු කොටු අළුත් වියෙන් පිරී තිබේ. නුඹට පමණක් නොව, නුඹේ මුළු පරපුරටම නුමුත් කුරුණි දහස බැගින් ගෙනයාමට දීමට වුවත් අපට වී ඇත්තේය. එබැවින් නුඹට උවමනා තරමක් වී ඔන්න ඔය ගෙයි මුල්ලෙන් ඇරගෙන පලයන්. ඒත් මුදල් නම් අපට එපා " යි, ගම්වැස්සන් කී බැව් රාජ පුරුෂයා තවදුරටත් කියා සිටියේය.

* * *

තමන්ගේ රට වැසියා නැතිබැරි කමෙන් තොරව, සාකල්‍යයෙන්ම සුඛිත මුදිතව ජීවත්වන බවටත්, රට සහලින් ස්වයංපෝෂිතවී ඇති බවටත් ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් බඳුවූ මේ ආරංචියෙන් මහා පරාක්‍රමබාහු නරනාථයන්ගේ මුව කොනෙහි පැසීගිය දළ රවුළු අතුරින් නිරාමිෂ ප්‍රීතියේ සොම්නස් සිනාරැල්ලක් නැගී ආ අයුරු පණිවුඩකාර රාජපුරුෂයා විසින් දක්නා ලදී.

.........එදවස පටන්, රට කිරි පැණියෙන් ඉතිර ගියේය. ලංකාව පෙරදිග ලෝකයේ ධාන්‍යාගාරය බවට පත් විය. සහල් රටට ඇති තරම් නොව නුවමනා තරම්ද විය. ඒවා කරදිය වලල්ලෙන් එපිටටද යැවුනෝය. ඒ සිංහල හැලේ බත කා වැඩුනු සිංහලසින් ගේ ලෙයින් පැවතෙන ඔබත්, මාත් මේ රටට සෞභාග්‍යයේ නවෝදය උදාකර දුන් ඒ ප්‍රභාපදිත් නරනාථයාගේ ජීවන ප්‍රවෘත්තිය ආදර්ශයට ගනිමින් යලිත් මේ බිමේ පැරකුම් යුගයක් උදාකිරීමට දිරි දරමු. වගාකළ හැකි හැම බිම් අඟලක්ම වගා කරමු. එමගින් රට හදමු. ...එනයින්, අපි හැදෙමු.